ඉඳුණු කෙස් සහිත මුස්ලිම්වරයාට හා අල් කුර්ආනය උසුලා ගෙන, එහි ඉක්මවා කටයුතු නොකොට ඉන් දුරස් නොවී කටයුතු කරන්නාට ගරු කිරීමත් යුක්තිගරුක බලධාරීන්ට ගරු කිරීමත් නියත වශයෙන්ම අල්ලාහ්ගේ අභිමානයෙන් වූවකි.

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැවසූ බව අබූ මූසා අල්
අෂ්අරී -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. “ඉඳුණු කෙස් සහිත මුස්ලිම්වරයාට හා අල් කුර්ආනය උසුලා ගෙන, එහි ඉක්මවා කටයුතු නොකොට ඉන් දුරස්
නොවී කටයුතු කරන්නාට ගරු කිරීමත් යුක්තිගරුක බලධාරීන්ට ගරු කිරීමත් නියත වශයෙන්ම අල්ලාහ්ගේ අභිමානයෙන් වූවකි. [හසන් ගණයට අයත් හදීසයකි] [ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත]

කෙනෙකුට යමක් ලැබීමත් ඔහු ගරු කරනු ලැබීමත් අල්ලාහ්ගේ අභිමානයෙන් ඇතිවන්නක් බව මෙම හදීසය පෙන්වා දෙයි. මෙම හදීසයේ සඳහන් කරුණු අතුරින් “ඉඳුණු කෙස් සහිත මුස්ලිම්වරයාට ගරු කිරීම“ යනු එකකි. එනම් ඉස්ලාමික වැඩිහිටියා, සභාවන්හි ගරු කරනු ලැබීම, ඔහු සමග කරුණාවෙන් කටයුතු කරනු ලැබීම, ඔහු සමග ලෙන්ගතුව ආශ්රය කරනු ලැබීම යනාදිය තුළින් අල්ලාහ් එම වැඩිහිටියා ගරු කිරීමය. මේ සියල්ල ඔහුගේ ගරුත්වයට හිමිවන අල්ලාහ්ගේ ගරුබුහුමන් වේ. “කුර්ආනය උසුලා ගෙන සිටින්නා“ එනම් අල් කුර්ආනය කටපාඩම් කර ගත් අයට ගරු කිරීමයි. ඔහුට ‘හාමිල්‘ උසුලන්නා යනුවෙන් මෙහි නම් කොට ඇත. එය සැබැවින්ම ඔහු තම හදවතෙහි එය උසුලා ගෙන සිටින බැවිනි. බොහෝ දුෂ්කරතාවන් මත එය උසුලන කල්හි එම බර තවතවත් අධික වෙයි. මෙම ගරුත්වය තුළට අල් කුර්ආනය කියවීම එයට අටුවාවන් ලිවීම යනාදියද ඇතුළත් වේ. මෙම හදීසයේ අල් කුර්ආනය උසුලන්නා යැයි මෙනෙහි කර ඇති සේම එය වර්ණනා දෙකකින් වෙන් කර සඳහන්වී පැමිණ ඇත. එනම්, “එහි ඉක්මවා කටයුතු නොකොට“ ඉක්මවීම යනු නියමිත සීමාවෙන් ඔබ්බට යාමයි. එනම් කුර්ආනය සමග කටයුතු කිරීමේදී සීමාව ඉක්මවා නොයාම, එහි සැඟවුනු රහස් දැනුමකින් තොරව විමර්ශනය කිරීම, එහි අර්ථයන් පිළිබඳ සැකයක් ඇති කර ගැනීම, එය කියවීමේදී හා අක්ෂර භාවිතයේ සීමාව ඉක්මවා යෑම වැනි කටයුතුවල නිරත වීමය. ඇතැමුන් ඉක්මවීම යනු තජ්වීද් නීතිරීති තුළ සීමාව ඉක්මවා යෑම හෝ අල් කුර්ආනයේ අර්ථය පරිශීලනය කිරීමෙන් වළක්වාලන අයුරින් කියවීමේදී ඇතැම් දෑ සැඟවීම. “ඉන් දුරස් නොවී“ එනම් අල් කුර්ආනය කියවීමෙන් එහි නීති පිළිපැදීමෙන් එහි අර්ථය තහවුරු කර ගැනීමෙන් එ් අනුව ක්රියාකිරීමෙන් දුරස් නොවී සිටීමය. මෙම අදහස ඉදිරිපත් කරන ‘ජෆා‘ යන පදයට තවත් අර්ථකතනයක් වනුයේ: දැනගත් පසු එය අතහැර දැමීමය. විශේෂයෙන් නොසැලකිල්ලෙන් හා පිටුදැකීමෙන් එය අමතක කරන විටය. නබි වදනේ පැමිණි ගරු කරනු ලබන අනෙක් පුද්ගලයා වනාහි, “යුක්තිගරුක බලධාරීයාය“ එනම් සාධාරණ ලෙස ක්රියා කරන්නා, යුක්තිය ඇත්තා යැයි වර්ණනා කරනු ලබන නීතිගරුක පුද්ගලයා යන්නයි. ඔහුට ගෞරවය හිමිවනුයේ ඔහු පොදු ජනයාට ප්රයෝනවත් වන ආකරයෙන් කටයුතු කිරීම හා ඔහුගේ අවධානය ඔවුන්ගේ යහපත උදෙසා පිහිටා තිබෙන බැවිනි.

http://www.sunnah.global/hadeeth/si/show/3032